# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1529 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 06/12/2023<br>පැය 0830 |

## මාධ්‍ය නිවේදනය

### ශ්‍රී ලංකා පොලිසියට රගර් ක්‍රීඩා තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.






















ශ්‍රී ලංකා රගර් සම්මේලනය විසින් වසරක් පාසා සංවිධානය කරනු ලබන අන්තර් ක්‍රීඩා සමාජය නිපෝන් පේන්ට් ලීග් තරගාවලියේ 2023/2024 ප්‍රථම තරගය 2023.12.02 වන දින පොලිස් කණ්ඩායම හා නාවික හමුදා කණ්ඩායම අතර තරගය බම්බලපිටිය පොලිස් ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

මෙම තරගයේදී ශ්‍රී ලංකා පොලිස් රගර් කණ්ඩායම ලකුණු 41 ට 22 වශයෙන් ලබාගෙන නාවික හමුදා කණ්ඩායම පරාජයට පත් කර ඇත. එහිදී මතීෂ පෙරේරා - උත්සාහයක දිනුම් 02 ක්ද, හිරන්ත පෙරේරා - උත්සාහයක දිනුම් 02 ක්ද, සුජාන් කොඩිතුවක්කු - උත්සාහයක දිනුමක් සහ ලහිරු තිලකරත්න - උත්සාහයක දිනුමක් ලෙස ජයග්‍රහණ ලබාගත් අතර තරගයේ වීරයා ලෙස ශ්‍රී ලංකා පොලිස් රගර් කණ්ඩායම නියෝජනය කළ මතීෂ පෙරේරා ක්‍රීඩකයා විසින් දිනාගෙන ඇත.

පොලිස් රගර් කණ්ඩායමේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු මහතා ද, ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිෂාම් ජමාල්ඩීන් මහතා ද, ප්‍රධාන පුහුණුකරු ලෙස නිලූෆ ඉබ්‍රාහිම් මහතා ද, කළමණාකරු ලෙස පොලිස් පරීක්ෂක එස්.එම්.එස්. සමරකෝන් නිලධාරියා සහ කණ්ඩායම් නායක ලෙස උප පොලිස් පරීක්ෂක මොහාන් විමලරත්න නිලධාරියා ද කටයුතු කරනු ලබයි.

මෙම අවස්ථාවේ ලබා ගන්නා ලද ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත එවමි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.